# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date: 2025.04.08 පැය 0825 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out / 678 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |


**පොලිස් විශේෂ කායර් බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

## 01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කායර් බලකා මූලස්ථාන කඳවුර.

2025.04.07 වන දින රාත්‍රී කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ කොළඹ 14 ප්‍රදේශයේදී පොලිස් විශේෂ කායර් බලකා මූලස්තාන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 350 ක් සහ ජාවාරමෙන් උපයාගත් බවට සැකකරන මුදල් රුපියල් 76,500/= සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

සැකකරු වයස අවුරුදු 44 ක් වන ස්ටේට් පාර, කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 02. මත් කරල් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - යාපනය පොලිස් විශේෂ කායර් බලකා කඳවුර.

2025.04.07 වන දින රාත්‍රී කාලයේ යාපනය පොලිස් වසමේ වන්නාපන්නෛ ප්‍රදේශයේදී යාපනය පොලිස් විශේෂ කායර් බලකා කඳවුරේ නිලධාරීන් සහ යාපනය පොලිස් ස්ථනායේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **මත් කරල් 100 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන යාපනය පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 26 ක් වන වන්නාපන්නෛ, යාපනය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

යාපනය පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 03. කේරළ ගංජා සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - කෑගල්ල පොලිස් විශේෂ කායර් බලකා කඳවුර.

2025.04.07 වන දින රාත්‍රී කාලයේ මාවනැල්ල පොලිස් වසමේ අන්වාරම ප්‍රදේශයේදී කෑගල්ල පොලිස් විශේෂ කායර් බලකා කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරුක් මත වැටලීමක් සිදුකර **කේරළ ගංජා ග්‍රෑම් 150 ක් සහ කේරළ ගංජා ග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට** ගෙන මාවනැල්ල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරුවන් අවුරුදු 25 සහ 42 වයස්වල පසුවන මාකෙහෙල්වල සහ කෝන්ගමුව ප්‍රදේශවල පදිංචිකරුන් වේ.**

මාවනැල්ල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 04. කේරළ ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - අනුරාධපුර පොලිස් විශේෂ කායර් බලකා කඳවුර.

2025.04.07 වන දින රාත්‍රී කාලයේ අනුරාධපුර පොලිස් වසමේ දේවානම්පියතිස්සපුර ප්‍රදේශයේදී අනුරාධපුර පොලිස් විශේෂ කායර් බලකා කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීම් සිදුකර **කේරළ ගංජා ග්‍රෑම් 250 ක්, ජවාරමෙන් උපයාගත් මුදල් බවට සැකකර රුපියල් 32580/= සහ විද්‍යුත් තරාදික් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන අනුරාධපුර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 46 ක් වන විජයපුර, අනුරාධපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනුරාධපුර පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 05. නීති විරෝධි මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වව්නතිව් පොලිස් විශේෂ කායර් බලකා කඳවුර.

2025.04.07 වන දින සවස් කාලයේ කොක්කඩිචෝල පොලිස් වසමේ තුඩිච්චකොඩිපල්ලම් ප්‍රදේශයේදී වව්නතිව් පොලිස් විශේෂ කායර් බලකා කඳවුරේ නිලධාරීන් සහ කොක්කඩිචෝල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් සමඟ වැටලීමක් සිදුකර **නීති විරෝධි මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා ලීටර් 300 ක් සහ යකඩ බැරල් 02 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 28 ක් වන සිල්ලිකුඩිආරු, කන්වනන්කුඩා ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොක්කඩිචෝල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 06. විදෙස් රටක නිෂ්පාදිත පිස්තෝල අවියක් හා මැගසීනයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කායර් බලකා බුද්ධි කොට්ඨාසය.

2025.04.07 වන දින උදෑසන කාලයේ මිරිහාන පොලිස් වසමේ තලපත්පිටිය ප්‍රදේශයේදී පොලිස් විශේෂ කායර් බලකා බුද්ධි කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **විදෙස් රටක නිෂ්පාදිත පිස්තෝල අවියක් සහ එම පතොරොම් ගැබක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන මිරිහාන පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 45 ක් වන සදලංකාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මිරිහාන පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 07. විදෙස් රටක නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - දඹුල්ල පොලිස් විශේෂ කායර් බලකා කඳවුර.

2025.04.07 වන දින රාත්‍රී කාලයේ නාඋල පොලිස් වසමේ උස්සැන්තැව ප්‍රදේශයේදී දඹුල්ල පොලිස් විශේෂ කායර් බලකා කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **විදෙස් රටක නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන නාඋල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරුවන් වයස අවුරුදු 34 ක් වන උස්සැන්නාව, නාඋල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

නාඋල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

08. **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - තංගල්ල පොලිස් විශේෂ කාර්‍ය බලකා කඳවුර.**

2025.04.07 වන දින සවස් කාලයේ වීරකැටිය පොලිස් වසමේ අත්තනයාල ප්‍රදේශයේදී තංගල්ල පොලිස් විශේෂ කාර්‍ය බලකා කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන වීරකැටිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 39 වන අත්තනයාල, මැදමුලන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වීරකැටිය පොලිස් ස්ථනය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**